# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2341/06 – 2023 ජූලි මස 17 වැනි සඳුදා – 2023.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: සී.අයි - 1823.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 215 හි පිහිටා ඇති ලංකා ටයිල්ස් පී. එල්. සී. සහ අනෙක් පාර්ශ්වය වශයෙන් දෙහිවල, නගර සභා පටුමග, අංක 10 හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2022 දෙසැම්බර් මස 14 වැනි දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනතවල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2023 අංක 01 දරන සාමූහික ගිවිසුම

**සාමූහික ගිවිසුම**

2022 දෙසැම්බර් මස 14 වැනි දින කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාරේ අංක 215 දරන ස්ථානයේ සිය ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන සමාගම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද සමාගමක් වන ලංකා ටයිල්ස් පී.එල්. සී. මෙහි මින් මතු "සේව්‍යයා" යනුවෙන් හඳුන්වනු ලබන එක් පාර්ශ්වයකටද, වෘත්තීය සමිති ආඥාපනත යටතේ ශ්‍රී ලංකාව තුළ නිසි පරිදි ලියාපදිංචි කරන ලද දෙහිවල, නගර සභා පටුමග, අංක 10 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය, මින්මතු වෘත්තීය සමිතිය යනුවෙන් හඳුන්වනු ලබන සංගමය අනෙක් පාර්ශ්වයටද ඇතුලත්ව එළඹෙන්නට යෙදුන සාමූහික ගිවිසුමයි.

ඉහත කී වෘත්තීය සමිතිය විසින් ඉහත කී සේව්‍යයා යටතේ ඇති සේවකයන්ගේ සේවා කොන්දේසි සම්බන්ධයෙන් සංශෝධනය කරන මෙන් සේව්‍යයා වෙතින් ඉල්ලා සිටිනු ලදුව ඉන් අනතුරුව පැවති සාකච්ඡාවලින් පසුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර පහත සඳහන් ගිවිසුම ඇති කරගන්නට යෙදුණි.

1. **ආවරණය වූ සහ බැඳීසිටින පාර්ශ්වයන්**

සේව්‍යයා හා වෘත්තීය සමිතිය ද එම වෘත්තීය සමිතියේ සාමාජිකයන් වන මෙම සේව්‍යයා යටතේ එම සමාගමේ සේවය කරනු ලබන මාසික වැටුප් ලබන මෙහෙයුම් ශ්‍රේණිවල (කය වෙහෙසා වැඩ කරන) පරිවාස සහ ස්ථිර පත්වීම් දරන සේවක මහත්ම/මහත්මීන් මෙම ගිවිසුමේ කොන්දේසි වලින් ආවරණය වෙති.

2. **ගිවිසුම ක්‍රියාත්මකවීම බලපැවැත්වෙන දිනය**

මෙම ගිවිසුම 2022 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන අතර, එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට ලිඛිතව මසක කල්දීමකින් අවලංගු කරන තෙක් බල පැවැත්වෙනු ඇත. කෙසේ වුවද 2025 මැයි මස 31 වැනි දිනට ප්‍රථම කිසිදු පාර්ශ්වයක් විසින් එවැනි කල් දීමක් නොකළ යුතු අතර, 2025 මැයි මස 31 වැනි දිනට ප්‍රථම ගිවිසුම බල රහිත නොවිය යුතුය.

3. **වේතන වැඩිවීම**

මෙම ගිවිසුම ක්‍රියාත්මක වන කාලපරිච්ඡේදය තුළ සෑම වසරකම ජුනි මස 1 වැනි දිනට පරිවාස සහ ස්ථිර සේවා පත්වීම් ලැබූ සේවානියුක්තිකයන්ට ගිවිසුම ක්‍රියාත්මක වන වර්ෂ 3 සඳහා රු.14,500/- ක වේතන වැඩි කිරීමක් පහත ආකාරයෙන් ලබා දීමට සේව්‍යයා එකඟ වේ.

| | *කාලපරිච්ඡේදය* | *මුදල රු.* |
|---|---|---|
| i. | 2022.06.01 සිට 2023.05.31 දක්වා | 5,500/- |
| ii. | 2023.06.01 සිට 2024.05.31 දක්වා | 6,000/- |
| iii. | 2024.06.01 සිට 2025.05.31 දක්වා | 3,000/- |

iv. මෙම ගිවිසුම බලාත්මක වන කාලපරිච්ඡේදය තුළ දී රජය යම් ලිඛිත නීතියක් මගින් වේතන වැඩිවීමක් සිදු කරනු ලැබේ නම් හා එම වැඩිවීම් මෙම ගිවිසුම මගින් වාර්ෂිකව ගෙවීමට එකඟ වී ඇති වැටුප් වැඩිකිරීමට වඩා වැඩි අගයක් ගනු ලබන්නේ නම් ගිවිසුම මගින් එකඟ වී ඇති වැඩිවීම් සහ රජය මගින් නීතිමය ප්‍රතිපාදන මගින් කරන ලද වැටුප් වැඩිවීම අතර වෙනස පමණක් ගෙවීමට සේව්‍යයා බැඳී සිටී.

4. **මාසික නිෂ්පාදන දිරි දීමනාව**

i. මොසැක් අංශය සඳහා නව මාසික දිරි දීමනාවක් හඳුන්වාදෙනු ලැබේ. එහිදී 85% ක නිෂ්පාදන ධාරිතා ඉලක්කය ඉක්ම වූ විට රු.1,500/- ක මුදලක් දැනට පවතින නිෂ්පාදන දිරි දීමනාවට එකතු කරන අතර නිෂ්පාදන ධාරිතාවය 100% ක් වූ විට රු. 2,000/- ක් දක්වා එය වැඩි කිරීමට සේව්‍යයා එකඟ වේ.

ii. මාසික නිෂ්පාදන දිරිදීමනාව දැනට ගෙවනු ලබන ක්‍රමවේදය යටතේම රු. 15,000/- ක ඉලක්කය ඉක්ම වූ විට රු.1,000/- ක මුදලක් එකතු කිරීමට සේව්‍යයා එකඟ වේ.

5. **පැමිණීමේ දිරි දීමනාව**

දැනට මෙම දීමනාව සඳහා බලපැවැත්වෙන සියලු කොන්දේසිවලට යටත්ව මසකට ගෙවනු ලබන රු. 3,750/- ක පැමිණීමේ දිරි දීමනාවට රු. 500/- ක් එකතු කර පහත ක්‍රමවේදයන්ට යටත්ව ගෙවීමට සේව්‍යයා එකඟ වේ. ඒ අනුව වැඩි කළ රු. 500/- න් රු. 250/- ක් 100% ක් පැමිණීම වාර්තා කරන සේවානියුක්තිකයින්ට ගෙවීමට සේව්‍යයා බැඳී සිටියි.

| *ආවරණය වන සේවානියුක්තිකයින්* | *පැමිණීමේ දීමනාවේ ප්‍රතිශතය %* | | |
|---|---|---|---|
| | *100% රු.* | *75% රු.* | *50% රු.* |
| යන්ත්‍ර ක්‍රියාකරුවන් / ගබඩා කරුවන් | 4,250/-<br>(3,750+500) x 100% | 3,000/-<br>(3,750+250) x 75% | 2,000/-<br>(3,750+250) x 50% |
| රියදුරුමහතුන් | 3,500/-<br>(3,000+500) x 100% | 2,437.50<br>(3,000+250) x 75% | 1,625/-<br>(3,000+250) x 50% |
| කාර්යාල කාර්ය සහායකවරුන් | 3,125/-<br>(2,625+500) x 100% | 2,156.25<br>(2,625+250) x 75% | 1,437.50<br>(2,625+250) x 50% |

6. **වෛද්‍ය රක්ෂණාවරණය**

දැනට පවතින කොන්දේසිවලට යටත්ව සේවක වෛද්‍ය රක්ෂණාවරණය පහත සඳහන් පරිදි 2023.06.01 දින සිට වැඩි කිරීමට සේව්‍යයා එකඟ වේ.

| *රක්ෂණ ආවරණ වර්ගය* | *පවතින වටිනාකම රු.* | *එකඟ වූ වටිනාකම රු.* |
|---|---|---|
| රෝහල් නේවාසික රක්ෂණාවරණය සඳහා | 50,000/- | 60,000/- |
| බාහිර රෝගී ප්‍රතිකාර සඳහා | 4,000/- | 5,000/- |

7. සිංහල අලුත් අවුරුදු නිවාඩු දින 04 හි යම් වැඩමුරයක සේවයෙහි යෙදෙන සේවානියුක්තිකයෙකු හට සහ මැයි 01 වැනි දින වැඩමුරයක සේවයෙහි යෙදෙන සේවානියුක්තිකයින් හට දැනට ගෙවනු ලබන රු. 1,000/- ක අමතර දීමනාව රු. 1,500/- ක් දක්වා වැඩි කිරීමට සේව්‍යයා බැඳී සිටී.

8. **රාත්‍රී සේවා මුර දීමනාව**

පහත සඳහන් ආකාරයෙන් වෙනස් කර ගෙවීමට සේව්‍යයා එකඟ වේ.

| *රාත්‍රී සේවා මුර වර්ගය* | *පවතින වටිනාකම රු.* | *එකඟ වූ වටිනාකම රු.* |
|---|---|---|
| සාමාන්‍ය රාත්‍රී සේවා මුරය සඳහා | 200/- | 250/- |
| අතිකාල රාත්‍රී සේවා මුරය සඳහා | 400/- | 550/- |

9. දැනට ගෙවනු ලබන රු. 12,500/- ක උත්සව අත්තිකාරම් මුදල රු. 18,000/- දක්වා වැඩි කිරීමට සේව්‍යයා එකඟ වේ.

10. **ආරාවුල් බේරුම් කිරීමේ පටිපාටිය**

සමිතිය පහත දැක්වෙන ආරාවුල් බේරුම් කිරීමේ පටිපාටියට එකගත්වය පළකර සිටී.

(අ) යම් දිනෙක ආරාවුලක් ඇති අවස්ථාවක සමිතියෙහි ශාඛා කමිටුව විසින් සේව්‍යයා වෙත ආරාවුල පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වන අතර සේව්‍යයාට එම ආරාවුල බේරුම් කිරීම සඳහා අවුම තරමින් සති දෙකක කාලයක් ලබා දිය යුතුය.

(ආ) සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත් එම කාරණය ප්‍රධාන වෘත්තීය සමිතියට සහ ලංකා සේව්‍යය සම්මේලනය (EFC) එකී ආරාවුල විසඳීම සඳහා පියවර ගැනීමට යොමු කළ යුතුය.

(ඇ) සාකච්ඡා වලින් අනතුරුව ලංකා සේව්‍යය සම්මේලනයේ සහ ප්‍රධාන වෘත්තීය සමිතියේ මැදිහත්වීමෙන් එම කරුණ නිරාකරණය කර ගැනීමට අපොහොසත් වූ කල්හි කම්කරු ආරාවුල් පනත යටතේ දැක්වෙන ආරාවුල් විසඳීමේ ක්‍රියාපිළිවෙත අනුගමනය කළ යුතුය.

(ඈ) කම්කරු දෙපාර්තමේන්තුවෙහි පැවැත්වෙන ආරාවුල් විසඳීමේ ක්‍රියාවලිය අසාර්ථක වූ කල්හි සමිතිය, වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට අවතීරණ වීමට තීරණය කර ඇති නම් එවැනි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සේව්‍යයාට සහ ලංකා සේව්‍යය සම්මේලනයට (EFC) සමිතිය විසින් දින 14 කට නොඅඩු ලිඛිත දැනුම්දීමක් කළ යුතුය.

11. ඉහත ප්‍රකාශිත ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය නොපිළිපදිනු ලබන්නේ නම් කිසිම දැනුම්දීමකින් තොරව වෘත්තීය සමිතියට සාමාජිකයන්ගේ මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩු කර යැවීමේ පහසුකම (Check Off) අහිමි කිරීමට සේව්‍යයා හා වෘත්තීය සමිතිය එකඟ වේ.

12. මෙකී ගිවිසුම ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය තුළදී කිසිදු පාර්ශ්වයක් මෙකී ගිවිසුමෙහි අන්තර්ගත වන කිසිදු කොන්දේසියක් හෝ නියමයක් සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් දේ ඇතුළත් කිරීමට කටයුතු නොකරන බවට "සේව්‍යයා" "සමිතිය" සහ මෙකී ගිවිසුමෙන් ආවරණය වන හා ඉන් බැඳෙන සේවා නියුක්තීන් මේ මගින් බැඳී සිටී. මෙකී ගිවිසුම මගින් ආවරණය වන හෝ බැඳී සිටින කිසිදු කරුණක් හෝ නියමයක් සම්බන්ධයෙන් "සමිතිය" සහ / හෝ සේවා නියුක්තීන් කිසිදු ආකාරයක හෝ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට එළඹීමට හෝ ඉල්ලුම් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීමටත් බැඳී සිටී.

13. "සමිතිය" සහ සේවා නියුක්තිකයන්ද නිෂ්පාදන ඉලක්ක ළඟාකර ගැනීමට ඔවුන්ගේ පූර්ණ සහයෝගය සහ අනුබලය සියලු කල්හි ලබාදීමටත් කම්හල තුළ කුමන හෝ ස්ථානයකදී සිදු කිරීමට පවරා ඇති සියලුම සේවාශ්‍රිත කටයුතු සේවා නියුක්තිකයින් විසින් ඉෂ්ඨ කිරීමටත් මෙහිදී එකඟව බැඳී සිටින්නේය.

14. මෙකී ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුළදී මූල්‍යමය ස්වභාවයක් ඇති කිසිදු හෝ ආකාරයක වෙනත් ඉල්ලීමක් ඉදිරිපත් නොකිරීමට සමිතිය හා සේවා නියුක්තීන් මෙයින් බඳී සිටී.

15. මෙකී සාමූහික ගිවිසුම කල් පිරෙන 2025 මැයි 31 දිනට ප්‍රථමයෙන් මාස දෙකකට කළින් මෙකී ගිවිසුම සංශෝධනය සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීමටද "සමිතිය" සහ සේවා නියුක්තීන් මෙයින් එකගත්වය පළකර සිටී.

ඉහත ප්‍රකාශිත සේවා කොන්දේසි සහ තත්ත්වයන්ට එකඟව සහ අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින බව පිළිගෙන ඉහත පාර්ශ්වයන් 2022 ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින රාජගිරිය, පරණ කෝට්ටේ පාර, අංක 385 ජේ 3 දරන ලිපිනයෙහි වූ ලංකා සේව්‍ය සම්මේලන කාර්යාලයේදී මෙයට අත්සන් තැබූ බව ප්‍රකාශ කරමු.

ලංකා ටයිල්ස් පී.එල්.සී හා
එම සමාගම වෙනුවෙන්

Director
LANKA TILES PLC

නම :
තනතුර : කළමනාකාර අධ්‍යක්ෂක

අන්තර් සමාගම් සේවක සමිතිය හා
එම සමිතිය වෙනුවෙන්

නම :
තනතුර :

සාක්ෂි :

අත්සන :
නම :
තනතුර :

අත්සන :
නම :
තනතුර :

EOG 07 - 0137